# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report

# 2019

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

தேசிய திட்டமிடல் திணைக்களம்
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு

Department of National Planning
Ministry of Finance, Economy and Policy Development

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 237

පිටු අංකය


01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 3

1.1. හැඳින්වීම 3
1.2. ආතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3. ප්‍රධාන කාර්යයන් 3
1.4. සංවිධාන සටහන 5
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6. අමාත්‍යාංශය/ අමාත්‍යාංශය යටතේ ඇති අරමුදල්/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව 6
1.7. විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) 6

02 පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

2.1 සාර්ව ආර්ථික සංවර්ධනය 7
2.2 කෘෂිකර්ම, වාරිමාර්ග , ඉඩම් , පශු සම්පත් හා ධීවර 7
2.3 කර්මාන්ත හා වෙළඳ, විදුලි බල හා බලශක්ති 11
2.4 මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන 12
2.5 නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර 13
2.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික 16
2.7 අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ 18
2.8 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ 22
2.9 රාජ්‍ය කළමනාකරණය හා පාලන 24
2.10 විමධ්‍යගත අයවැය 25

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 25
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 25
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 27
3.3 මුදල් ප්‍රවාහක පිළිබඳ ප්‍රකාශය 29
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 31
3.5 අදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 31
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 32
3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙමදෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 33

3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය 33

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 33

04 පරිච්ඡේදය -කාර්ය සාධන දර්ශක 34
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 34

05 පරිච්ඡේදය - තිරිසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 34
5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න 34
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න 34

06 පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ 34
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 34
6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න. 35
6.3 මානව සම්පත් සංවර්ධනය 35

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 41

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලද අතර ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනියුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

### මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම

### අරමුණු

1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම
2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම

- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන රාමුවක් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති යෝජනාඇගයීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- ආංශික ප්‍රවේශය ගොඩනැංවීම සඳහා මූලිකත්වය ගැනීම
- අවශ්‍ය විටෙක සැලසුම් ක්‍රම යාවත්කාලීන කිරීම
- ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට මාර්ග උපදේශ සැපයීම
- විශේෂ/ කලාපීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය සඳහා ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- නිකුත් කිරීමේ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නිර්දේශිත ව්‍යාපෘති සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම (ක්‍රියාත්මක කිරීම දක්වා)
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

## 1.4 ආයතනික සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 9 කට වෙන් කර ඇත. එම අංශ 9 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 9 කට වෙන් කර ඇත. එම අංශ 9 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

### දෙපාර්තමේන්තුවේ අංශ

- සාර්ව ආර්ථික සංවර්ධනය
- කෘෂිකර්මය, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් හා ධීවර
- කර්මාන්ත සහ වෙළඳ, විදුලිබල හා බලශක්තිය
- මාර්ග, වරාය, ගුවන් සේවා සහ ප්‍රවාහන
- නාගරික සංවර්ධනය, නිවාස, ජලය, පරිසරය සහ ආපදා කළමනාකරණය
- සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා, සංස්කෘතික හා ආගමික කටයුතු
- අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ
- කලාපීය සංවර්ධනය, සංචාරක හා සමාජ ආරක්ෂණ
- රාජ්‍ය කළමනාකරණය සහ පාලනය

## 1.6. අමාත්‍යාංශය/ අමාත්‍යාංශය යටතේ ඇති අරමුදල්/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව

දෙපාර්තමේන්තුව යටතට එන ආයතන / අරමුදල් නොමැත

## 1.7 විදේශ අධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

1. **ව්‍යාපෘතියේ නම:** ක්‍රමලේඛන ව්‍යාපෘති සකස් කිරීමේ පහසුකම
2. **ආධාර දෙන ආයතනය:** ලෝක බැංකුව
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** - රු. 325 Mn
4. **ව්‍යාපෘති කාලය:** 2018-2020

# 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 සාර්ව ආර්ථික සංවර්ධනය

සාර්ව ආර්ථික අංශයේ අරමුණ වන්නේ ජාතික සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති, ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති බවට පරිවර්තනය කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ වලට අවශ්‍ය සහය ලබා දීම වේ. තවද, ජාතික හා ජාත්‍යන්තර තත්වයන් විශ්ලේෂණය කරමින් අනෙකුත් අංශ වලට ආංශීය උපාය මාර්ග සැදීමට හා ආංශීය සැලසුම් සමාලෝචනය කිරීමට අවශ්‍ය යෙදවුම් ලබා දෙයි.

### ප්‍රගතිය

- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2019-2021 යාවත්කාලීන කිරීමේ මූලික කටයුතු සම්පූර්ණ කිරීම.
- මුදල් අමාත්‍යාංශයේ 2018 වාර්ෂික වාර්තා සඳහා විශේෂ සටහනක් සකස් කරන ලදි.
- 2018 මහ බැංකු වාර්තාව සැදීමට අවශ්‍ය රාජ්‍ය ආයෝජන වැඩසටහන 2019-2021ට අදාල තොරතුරු එක්රැස් කිරීම හා ලබා දීම.

## 2.2 කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, පශු සම්පත් හා ධීවර

**කෘෂිකාර්මික අංශය**

රටේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි අංශය කැපීපෙනෙන දායකත්වයක් දක්වනු ලබන අතර, මෙහිදී ශ්‍රම බලකායේ දක්වන දායකත්වය හා අනෙකුත් ආර්ථික අංශයන්හි සංවර්ධනය සඳහා දක්වන සම්පත් දායකත්වය විශේෂ වේ. ප්‍රතිපත්තිමය වශයෙන් වර්තමානයේදී කෘෂි අංශය නවීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර මෙහිදී ඉහළ ඵලදායීතාවයක් ලබා ගත හැකි මෙන්ම නවීන තාක්ෂණය භාවිතා කරමින් තිරසාර කෘෂිකර්මාන්තයක් කෙරෙහි යොමු වීමට ප්‍රධාන අවධානය යොමු වී ඇත. මෙහිදී ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම මෙන්ම ජත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. ඒ අනුව කෘෂි කාර්මික අංශය සඳහා ආයෝජනය කරන ලද ප්‍රතිපාදන කෘෂි කාර්මික අංශයේ ප්‍රධාන අංගයන් ප්‍රවර්ධනය මඟින් ප්‍රතිදාම ශක්තිමත් කිරීම, නිර්ණායක ප්‍රවර්ධනය මඟින් කෘෂි කාර්මික අංශයේ ප්‍රමිති වර්ධනය හා ප්‍රවර්ධනය (Good Agriculture practices), නවෝත්පාදක හා ඵලදායී තාක්ෂණ සහ වෙළඳපොළ ඒකාබද්ධ කිරීමත් සමඟ සාධක ඵලදායීතාවය වැඩි දියුණු කිරීම ආදිය සඳහා යොදා ගෙන ඇත. එසේම දේශගුණික විචල්‍යතාවයන් නියඟය, ගංවතුර ආදීය සැලකිල්ලට ගනිමින් කෘෂි කාර්මික අංශය සංවර්ධනය කෙරෙහි ද වැඩි අවධානයක් ලබා දී ඇත.

**බෝග කෘෂිකර්මය**

බෝග කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා රජය 2019 වර්ශයේ දී ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත. රජයේ ආයෝජන ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා අපනයනය තුළින් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම කෙරෙහි යොමු කර ඇත. මීට අමතරව අපනයන නිෂ්පාදන වෙළඳපොළ ඉලක්කර ගනිමින් පළතුරු හා කුළුබඩු නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා විශාල පරිමාණ බෝග නිෂ්පාදන කලාපයන් ඇති කිරීම ද සිදු කරන ලදී. එසේම ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර සහ දේශිය පරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන වල ගුණාත්මක ප්‍රමිතින් වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ආරම්භ කරන ලදී . එහිදී යහපත් කෘෂිකාර්මක සැලැස්ම සකස් කිරීම මඟින් පරිභෝජනය

සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට සඳහා පියවර ගෙන ඇත. අපනයන කෘෂිකර්මාන්ත සඳහා කේෂ්ත්‍රය පවතින බාධාවන් ඉවත් කිරීම කෙරෙහි රජයේ ප්‍රධාන අවධානය යොමු වී ඇත. ඒ අනුව 2019 වර්ෂයේදී බෝග කෘෂිකර්මය සංවර්ධනය සඳහා රු බිලියන 12 ක් ආසන්න වශයෙන් ප්‍රාග්ධන ආයෝජන ලෙස වෙන් කර ඇත.

<u>ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අවසන් කරන ලද ක්‍රියාකාරකම්</u>

- ව්‍යාපෘති යෝජනා 23 ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- කෘෂිකාර්මික අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 18 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම
- කෘෂිකර්ම ක්ෂේත්‍රයට අයත් අංශ සියල්ලටම අදාළව  කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමට සියලු පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කිරීම හා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සහ ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබාදීම.

**වාරිමාර්ග හා ඉඩම්**

2019 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 45.51 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 38.79 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් ආරම්භ කොට ඇති මහවැලි ජල සුරක්ෂිතතා ආයොජන වැඩසටහන, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, ගල් ඔය ජලාශ ව්‍යාපෘතිය,මොරාන ජලාශ ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය, දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම වාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

2019 දී ඉඩම් අංශයෙහි සමස්ත වියදම රු. මිලියන 8,644 ක් වන අතර එයින් රු. මිලියන 3,172 ක් ප්‍රාග්ධන වියදම් වේ. 2019 දී ඉඩම් හිමිකම් වැඩ සටහන (බිම්සවිය) සඳහා සැලකිය යුතු මුදලක් වැය කර ඇත. 2019 දී රාජ්‍ය සංවර්ධන වැඩසටහන් සඳහා ඉඩම් හඳුනාගෙන අත්පත් කිරීම සිදු කර ඇත.

<u>වාරි අංශයට අයත් විශේෂ වැඩසටහන</u>

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි පුහුණුවන ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවාවේ ආධුනික නිලධාරින් සඳහා වාරිමාර්ග ක්ෂේත්‍රෙය් වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

- මහජන බෙදාහැරීම් හා ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් තෝරාගත් ගොවි සංවිධාන සඳහා වී වියලීමේ යන්ත්‍ර ප්‍රසම්පාදනය සහ ණය වාරික ආපසු ගෙවීමේ හැකියාව සම්බන්ධයෙන් පිරිවැය සහ ප්‍රතිලාභ විශ්ලේෂණයක් සකස් කිරීම.

- ගංවතුර අවම කිරීම , ආපදා වැලැක්වීම සහ ජල සම්පත් සංව ර් ධ නය ට අදාළව 2019-2024 කාල පරිච්ඡේදය තුළ සිදු කිරීමට නියමිත ව්‍යාපෘති ඇතුළත් ප්‍රමුඛතා ලේඛණයක් සකස් කිරීම.

- වාරිමාර්ග සහ ඉඩම් අංශයේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ව්‍යාපෘති සැලසුම්කරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

<u>ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්</u>

1. වාරි අංශයේ ව්‍යාපෘති වාර්තා 08 හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 01 ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.

2. කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාර්මාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 25 කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.

3. මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂණ ආයෝජන වැඩසටහන, යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය හා තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රීයව දායකවීම.

4. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලොචන රැස්වීම්වලට සක්‍රීයව දායකවීම.

5. වාරිමාර්ග හා ඉඩම් අංශයට අදාල තොරතුරු සපයමින් රාජ්‍ය ආයෝජන සැලැස්ම (2019-2021) යාවත්කාලීන කිරීමට සහාය වීම.

6. රේඛීය අමාත්‍යාංශ, අදාල පාර්ශවකරුවන් සහ ලෝක බැංකුව සමඟ ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මෙහි කෙටුම්පත සකස් කිරීමට අදාල තාක්ෂණික සහයෝගය සැපයීම.

**පශු සම්පත් අංශය**

පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරිගව, කුකුළු, සූකර සහ එළුවන් යන උප අංශ වලින් සමන්විත වේ. මෙම අංශය මෙරට තුළ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමටත්, ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් දායකත්වයක් ලබා දේ. පශු සම්පත් ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් පශු නිෂ්පාදන වල මිල දැරිය හැකි මිලකට පවත්වා ගෙන යාමත් පශු නිෂ්පාදන ආශ්‍රිත රැකියා සහ ආදායම් ඉහල නැංවීමත් සිදු කරන අතරතුර, පශු සම්පත් ව්‍යාපාර ශක්තිමත් කිරීමත් අරමුණු කෙරේ. 2019 වර්ෂයේ පශු සම්පත් අංශය සඳහා රාජ්‍ය ආයෝජනය ප්‍රධාන වශයෙන් කිරි සැකසුම් කර්මාන්තශාලා නවීකරණය, , කුඩා කිරි සමුපකාර සමිති සංවර්ධනය කිරීම, පශු සම්පත් සෞඛ්‍ය වැඩිදියුණු කිරීම, සත්ව රෝග නිවාරණය සහ අභිජනන වැඩසටහන්, පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ හා නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කර ඇත.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පශු සම්පත් අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති වාර්තා 03 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

විශේෂ වැඩසටහන්

- රේඛීය අමාත්‍යාංශවල සහ ආයතනවල නිලධාරීන් සඳහා "සංවර්ධන ව්‍යාපෘති යෝජනා සඳහා නව ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය" පිළිබඳ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ආරම්භක වැඩමුළුවට සහාය ලබා දීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා පශු සම්පත් අංශය පිළිබඳ සටහන සකස් කිරීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ව්‍යාපෘති ලැයිස්තුව යාවත්කාලීන කිරීම
- "කිරි ගවයන් 20,000 ක් ආනයනය කිරීම" පිළිබඳ ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- පශු සම්පත් අංශයට අදාළ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීමට සහභාගී වීම

**ධීවර අංශය**

රටේ ආර්ථික වර්ධනයට සහ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා විශාල දායකත්වයක් ලබා දෙන ප්‍රධාන අංශයක් ලෙස ධීවර අංශය හඳුනාගෙන ඇති අතර එය මිලියන 2.6 ක පමණ ජනතාවකට ජීවනෝපාය සපයමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. වර්තමානයේ වාර්ෂික ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් 53% ක් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වලින් පරිපූර්ණ වේ. 2019 දී මෙම අංශයේ රාජ්‍ය ආයෝජනය ධීවර වරාය සහ නැංගුරම් ස්ථාන ගොඩනැංවීම, නවීන තාක්ෂණය හඳුන්වාදීම, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, ජලජීවී වගා නිෂ්පාදනය වැඩිදියුණු කිරීම, පර්යේෂණ හා සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව බල ගැන්වීම සඳහා වෙන් කරන ලදී.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ධීවර අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති වාර්තා 07 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

විශේෂ වැඩසටහන්

- රේඛීය අමාත්‍යාංශවල සහ ආයතනවල නිලධාරීන් සඳහා "සංවර්ධන ව්‍යාපෘති යෝජනා සඳහා නව ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය" පිළිබඳ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ආරම්භක වැඩමුළුවට සහාය ලබා දීම.
- ප්‍රංශ රජයේ ආධාර යටතේ (AFD) ධීවර වරායන් 4 ක් පිළිබඳ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකස් කිරීමේ නේවාසික වැඩමුළුවකට සහභාගී වීම.
- කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතියේ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීමට සහභාගී වීම.
- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති (CARP) පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලයේ ජලජ සම්පත් පිළිබඳ ජාතික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ධීවර අංශය පිළිබඳ සටහන සකස් කිරීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ව්‍යාපෘති ලැයිස්තුව යාවත්කාලීන කිරීම

- ධීවර අංශයට අදාළ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීමට සහභාගී වීම.

වෙනත් කටයුතු

- IFAD විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ උපායමාර්ග හා වැඩසටහන් ඇගයීම පිළිබඳ වැඩමුළුවට සහාය වීම.

## 2.3 කර්මාන්ත හා වෙළඳ, විදුලි බල හා බලශක්ති

**කර්මාන්ත, වෙළඳ හා කම්කරු අංශය**

කර්මාන්ත, වෙළඳ හා ආයෝජන අංශ ආර්ථිකයේ වැදගත් උපාය මාර්ගික අංශ ලෙස හඳුනාගෙන තිබේ. එමනිසා, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර, ජාත්‍යන්තර වෙළඳාම හා විදේශ ඍජු ආයෝජන හරහා ඉහත අංශ ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති යෙදවුම් ලබා දේ. එසේම, ව්‍යාපෘති යෝජනා ඇගයුම් කටයුතුවලට සම්බන්ධ වෙමින් ආංශික මූල්‍යනය කටයුතු සඳහා දායක වේ. රටේ අවශ්‍යතාවයන් හඳුනාගනිමින්, 2019 වර්ෂය තුළදී පහත කාර්යයන් සිදු කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 49ක් ඇගයීමට ලක් කරන ලද අතර අදාළ නිර්දේශ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදී.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනලද අමාත්‍ය මණ්ඩල සංදේශ 07ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- 2018-2021 කාල රාමුව සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ලබාදෙමින් සහය වීම.
- "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා ආංශික ප්‍රතිපත්තිමය දායකත්වය ලබාදීම.
- තිරසාර සංවර්ධන අභිමාතාර්ථ 2030 වැඩසටහන සඳහා ආංශික යෙදවුම් (Sectorial Input) ලබා දීම.

**කම්කරු සහ විදේශ රැකියා**

කම්කරු හා විදේශ රැකියා ප්‍රතිපත්ති මඟින්, දේශීය හා විදේශීය රැකියාවල නිරත වීමෙන් ප්‍රේෂණ වැඩි කිරීම තුළින් ජාතික ආර්ථිකයට දායක වන සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, දැනට පවත්නා නීති රීති බලාත්මක කිරීම හා ඉදිරියේදී සිදු විය යුතු ප්‍රතිසංසකරණ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සමගාමීව සිදු කිරීමටත් අවශ්‍ය වේ. එම අවශ්‍යතාවයන් හඳුනාගනිමින්, 2019 වර්ෂය තුළදී පහත කාර්යයන් සිදු කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 6 ක් ඇගයීම හා අවශ්‍ය නිර්දේශ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදී.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනලද අමාත්‍යමණ්ඩල සංදේශ 05ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- 2018-2021 කාල රාමුව සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ තොරතුරු ලබාදෙමින් සහය වීම.

- "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා ආංශික ප්‍රතිපත්තිමය දායකත්වය ලබාදීම.
- තිරසාර සංවර්ධන අභිමාතාර්ථ 2030 වැඩසටහන සඳහා ආංශික යෙදවුම් (Sectorial Input) ලබා දීම.

**විදුලිබල හා බලශක්ති අංශය**

විදුලිබල හා බලශක්ති අංශය විදුලිබල සහ ඛනිජ තෙල් කර්මාන්ත නියෝජනය කරයි. මෙම කර්මාන්ත දෙකම ප්‍රධාන වශයෙන් කළමනාකරණය කරනු ලබන්නේ රජය සතු ව්‍යවසායයන් විසිනි. විදුලිබල අංශය සඳහා වන පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඉතා අඩු අගයක පවතින අතර ඛනිජ තෙල් අංශයේ පෞද්ගලික අංශයේ සහභාගීත්වය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විදුලි පරිභෝජනය 2018 දී 650 kWh වූ අතර මෙය අඛණ්ඩව ඉහළ යමින් පවතී. අපේක්ෂිත ආර්ථික වර්ධනයත් සමඟ කර්මාන්ත හා සේවා අංශවලින් විදුලිබල හා බලශක්ති අංශයට ඇති ඉල්ලුම ද අඛණ්ඩව ඉහළ යනු ඇත. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ මෙම ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමේ මෑත කාලීන ප්‍රවණතාව රජය විසින් ද ප්‍රවර්ධනය කර ඇත. ඒ අනුව, විදුලිබල උත්පාදන ප්‍රභවයන් ගල් අඟුරු, ස්වාභාවික වායු, ජල හා තෙල් වැනි සම්ප්‍රදායික ප්‍රභවයන්ගේ සිට සූර්ය, සුළං, සාගර තරංග, භූතාපජ හා ජෛව ස්කන්ධ වැනි සම්ප්‍රදායික නොවන ප්‍රභවයන් දක්වා විහිදේ. මෙම අංශයේ "කාබන් මධ්‍යස්ථභාවය" උල්ලංඝනය නොකර විදුලිබල හා බලශක්ති අංශය සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ද පූර්ණ සහයෝගය ලබා දී ඇත. 2019 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි දායකත්වය පහත පරිදි සාරාංශගත කළ හැකිය.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 14 ක් ඇගයීමට ලක් කර නිරීක්ෂණ ලබා දී ඇත.
- "ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" පිළිබඳ කැබිනට් සංදේශය ඇතුළුව කැබිනට් සංදේශ 4 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.
- ශ්‍රී ලංකාවෙහි න්‍යෂ්ටික බලශක්ති සංවර්ධන වැඩසටහන පිළිබඳ කමිටුවල කටයුතු කිරීම.
- ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේදී තාක්ෂණික සහාය ලබා දීම.
- "ස්වාභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග" පිළිබඳ මහජන අදහස් විමසීමේදී එය වැඩි දියුනු කිරීම සඳහා කරුනු දැක්වීම

## 2.4 ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා ගුවන්

මෙම අංශ ප්‍රධාන වශයෙන් අරමුණු කරනුයේ රට තුළ සහ ලෝකයේ සෙසු රටවල් සමඟ මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීමයි. ඒ යටතේ අධිවේගී මාර්ග සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා පුනරුත්ථාපනය කිරීම, මාර්ග නඩත්තු කිරීම සහ පාලම් ඉදිකිරීම, නවීකරණය තුළින් පොදු ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීම, නාගරික ග්‍රාමීය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම, නාගරික මාර්ග තදබදය අඩු කිරීම, මාර්ග අනතුරු අවම කිරීම සහ වරාය සහ ගුවන් තොටුපල යටිතල පහසුකම් පුළුල් කිරීම, 2019 වසර තුළ ආයෝජනය සඳහා ප්‍රමුඛතාව ලබාදුන් අංශ වේ.

විශේෂිත වූ කාර්යයන්

- රේඛිය අමත්‍යාංශය මගින් යොමු කළ ඉහත විෂයන් වලට අදාළ ව්‍යාපෘති යෝජනා සහ වැඩසටහන් 43 ක් ඇගයීම
- මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය , ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සහ වරාය හා නාවික අමාත්‍යාංශය මගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 15 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
- පහත සඳහන් කමිටු වල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
    - ප්‍රවාහන ප්‍රතිපත්ති යටත්කාලීන කිරීමේ කමිටුව, මාර්ග ප්‍රතිපත්තිය සැකසීමේ කමිටුව, ජාතික වරාය සහ සාමුද්‍රීය ප්‍රතිපත්තිය සැකසීමේ කමිටුව
    - බස් ගාස්තු සංශෝධනය කිරීම සහ බස් බලපත්‍ර නිකුත් කිරීම
    - සැහැල්ලු දුම්රිය (LRT) පද්ධතියේ නඩත්තු සහ මෙහෙයුම් යන්ත්‍රනය සකස් කිරීමේ කමිටුව
    - සැහැල්ලු දුම්රිය පද්ධතිය සහ කොළඹ නාගරික දුම්රිය නවීකරණය කිරීම, ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන, “සහසර ”බස් නවීකරණ වැඩසටහන, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව, ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වල ව්‍යාපෘති මෙහෙයුම් කමිටු.
    - අනුරාධපුර සහ යාපනයේ ව්‍යවසාය ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනය සඳහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් සම්බන්ධීකරණ නිලධාරී

- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා අදහස් දැක්වීම.

## 2.5 නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර

**නාගරික සංවර්ධන හා නිවාස අංශය**

නාගරික සංවර්ධන හා නිවාස අංශය අදාළ රේඛීය අමාත්‍යාංශ හා සම්බන්ධව කටයුතු කරමින් රට තුළ නාගරික යටිතල පහසුකම් ස්ථාපිත කිරීමටත්, පවතින පහසුකම් විධිමත් ලෙස සකස් කිරීමටත්, නිවාස පහසුකම් වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනයටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය දායකත්වය සපයනු ලබයි.

රටක ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබන්නේ ආර්ථික විභවතාවයන් ඒකරාශී වී පවතින නාගරික ප්‍රදේශයන් විසිනි. අපේ රටේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් දැනටමත් ජීවත් වන්නේ නාගරීකරණය වූ ප්‍රදේශවල ය. කෙසේ වෙතත්, නාගරීකරණය මැනීම සඳහා සුදුසු ස්ථාපිත නිර්ණායක නොමැති වීම නිසා රටේ නාගරීකරණ ප්‍රතිශතය නිවැරදිව තක්සේරු කිරීම දුෂ්කර ය. නගර තුළ පවතින සංවර්ධන විභවතාවයන් හඳුනා ගැනීම අනාගත ආයෝජන විධිමත් ලෙස ස්ථානගත වීම සඳහා අවකාශ සලසනු ලබයි. එමනිසා, තිරසාර නාගරීකරණයට ඇති බාධාවන් අවම කිරීමට සහ ආර්ථිකයේ නියමිත ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා ක්‍රමානුකූලව, අන්තර් සම්බන්ධිතව හා ප්‍රවේශ විය හැකි පරිදි නාගරික සංවර්ධනය හැඩ ගැස්විය යුතු ය.

රටේ පවුල් මිලියන 6ක් අතරින් කිසියම් ආකාරයක නිවසක් ඇත්තේ මිලියන 5.2ක් සඳහා පමණි. එබැවින්, තමන්ගේ ම නිවසක් නොමැති පවුල් සංඛ්‍යාව 800,000 ඉක්මවයි. එසේම, වර්තමාන නිවාස සංඛ්‍යාවෙන් 300,000කට ආසන්න ප්‍රමාණයක් තාවකාලික එකලස් කිරීම් බැවින් මෙම ගැටළුව තවදුරටත් තීව්‍ර වී තිබේ.

එබැවින්, තිරසාර නාගරීකරණයක් ඇති කිරීම සඳහාත්, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහාත්, නිවාස පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහාත් නාගරික ප්‍රදේශ සහ නිවාස විධිමත්ව හා මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනය කිරීමට ඉවහල් වන ව්‍යාපෘතීන් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සැලසීමට සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීමට මෙම අංශය දායකත්වය සපයනු ලැබේ.

<u>ක්‍රියාකාරකම්</u>

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 12ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- නාගරික සංවර්ධනය හා නිවාස සම්බන්ධ ව්‍යාපෘති යෝජනා 58ක් ඇගයීමට ලක් කර අවශ්‍ය කටයුතු සඳහා යොමු කිරීම
- අතිගරු ජනාධිපතිතුමන්ගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" මැතිවරණ ප්‍රකාශය මත පදනම්ව ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම
- නාගරික සංවර්ධන හා නිවාස අංශයට අදාළ වාර්තා සකස් කිරීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම
- පිටකොටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, හෝමාගම තාක්ෂණ නගරය හා උපායමාර්ගික නගර සංවර්ධන වැඩසටහන යන ව්‍යාපෘතීන්ට අදාළ මෙහෙයුම් කමිටු රැස්වීම් වලට සහභාගී වෙමින් අවශ්‍ය මාර්ගෝපදේශනය සැපයීම
- අදාළ රේඛීය අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කෙරෙන විවිධ ව්‍යාපෘති තුළ හඳුනාගත් ගැටළු නිරාකරණය කිරීම සඳහා හවුල්කරුවන් සමග සාකච්ඡා පැවැත්වීම සහ සංවර්ධන අවශ්‍යතා නිවැරදිව හඳුනාගැනීමට අවශ්‍ය දායකත්වය ලබාදෙමින් එම කටයුතු ජාතික සංවර්ධන න්‍යාය සමග අනුගත කිරීම
- රේඛීය ආයතන දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම

**ජල සම්පාදනය හා සනීපාරක්ෂාව**

ජනතාවගේ ජීවන තත්ත්වය හා රටේ සමාජ ආර්ථික සංවර්ධනය ඉහල නැංවීම සඳහා ජනතාවට අවශ්‍ය ආරක්ෂිත පානීය ජලය හා දියුණු සනීපාරක්ෂක පහසුකම් සැපයීම අත්‍යාවශ්‍ය වේ.ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය , ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආංශීය පාර්ශවකරුවන් සමඟ සමීපව වැඩ කටයුතු කරන අතර ආංශීය ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් සහ මඟ පෙන්වීම් මෙම ආයතන වලට සැපයීම සිදු කරනු ලැබේ. තවද, මෙම වසර තුළ පහත දැක්වෙන ආංශීය කාර්යයන් මෙම අංශය මගින් නිම කර ඇත.

නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද පහත ව්‍යාපෘති යෝජනා මූලික අධ්‍යයනය සිදු කර ඒවා සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අදහස්, නිරීක්ෂණ හා ව්‍යාපෘති වලට අදාළව සකස් කරන ලද නිර්දේශ වාර්තා අදාළ පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

- යෝජිත මඩු ජල සම්පාදන ව්‍යාපෘතිය.
- ඒකාබද්ධ ජල සම්පාදන ආයෝජන වැඩසටහන යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රමුඛතා ව්‍යාපෘති යෝජනාව.
- තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය - මාහේන්වත්ත, පිටිපන පිහිටි නියමු ව්‍යාපෘතිය සඳහා වන ජල යෝජනා ක්‍රමය.
- අයවැය යෝජනා *2019* - ප්‍රජා ජල අභිමන් වැඩසටහන.
- දෙනියාය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම.
- අදියර *II* - අනුරාධපුරය උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය -(විෂය පථය වෙනස්වීම)
- ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක අරමුදල් සඳහා වන යෝජනාව.
- විසල් වවුනියා ජල සම්පාදන ව්‍යාපෘතිය.

*2.* අදාල අමාත්‍යාංශය මගින් යොමු කරන ලද පහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශ වලට ආදාළව නිරීක්ෂණ සකස් කිරීම.

- හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය.
- කල්මුනේ නගරය සඳහා වන අපජල රැස්කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය.
- පානීය ජල හා සනීපාරක්ෂණ අංශයේ ජාතික බහුපාර්ශව සම්බන්ධීකරණ වේදිකාවක් පිහිටුවීම.
- ඕස්ට්‍රියානු ණය යෝජනා ක්‍රමයක් යටතේ උතුර ,නැගෙනහිර හා වයඹ පළාත් වල සිටින අඩු පහසුකම් ඇති ග්‍රාමීය ජනතාවට කඩිනම් ජල පහසුකම් සැපයීම.
- හම්බන්තොට වරාය හා යේජිත විශේෂිත කර්මාන්ත කලාපය ආවරණය වන හම්බන්තොට ඒකාබද්ධ ජල සම්පාදන හා මළාපවහන ව්‍යාපෘතිය.
- ඒකාබද්ධ ජල සම්පාදන ආයෝජන වැඩසටහන - අදියර *1* ක්‍රියාත්මක කිරීම.

*3.* ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් - පුත්තලම දිස්ත්‍රික්ක සැලසුම සඳහා ආංශීය පරිච්ඡේදය සකස් කිරීම.

*4.* විදේශීය ණය නියෝජිත ආයතන විසින් ඉදිරිපත් කරන ලද විදේශිය ණය ගිවිසුම් සම්බන්ධයෙන් වන සටහන් සමාලෝචනය කිරීම හා විදේශිය දූත මණ්ඩල ප්‍රාරම්භක රැස්වීම් සිදු කිරීම හා දැනට කරගෙන යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.

- ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ *AFD* යන අරමුදල් සපයන නියෝජිත ආයතන විසින් අරමුදල් සපයනු ලබන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දූත මණ්ඩල (*Missions*) සමඟ අදාළ ප්‍රාරම්භක රැස්වීමට සංවිධානය කිරීම.
- විදේශීය දූත මණ්ඩල සමඟ ප්‍රාරම්භක රැස්වීම් ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.
- ජල සම්පාදන හා අපජල ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.

*5.* රාජ්‍ය ආයෝජන වැඩසටහන - ජල හා සනීපාරක්ෂණ ක්ෂේත්‍රයේ *2019-2021* කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.

*6.* ජල හා සනීපාරක්ෂණ අංශයේ ප්‍රධාන සැලැස්ම - ජල හා සනීපාරක්ෂණ අංශය සඳහා වන ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එයට අදාලව වැඩමුළු හා රැස්වීම් වලට සහභාගී වෙමින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තුමේන්තුවේ දායකත්වය ලබා දීම.

**පරිසර කළමනාකරණය**

නියමිත ආයෝජනයන් සිදු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට පහසුකම් සපසන අතරතුරදී පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමු වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛවවිවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ ස්වාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමු වී ඇත. තරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මනා පරිසර කළමනාකරණය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන ජෛවවිවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

එසේම රට තුළ ස්වාභාවික විපත් ඇති වීමේ ප්‍රවණතාවය සීඝ්‍රයෙන් ඉහළ යනඅතර එමඟින් රටට සිදුවන හානිය ඉමහත්ය. එබවින් රජය විසින් ජනතාවගේ සමෘද්ධිය, අභිමානය සහ සාමකාමී ජීවන රටාව තහවුරු කිරීම සඳහා ස්වාභාවික සහ මිනිස් ක්‍රියාකාරකම් මඟින් සිදුවන ආපදා වැළැක්වීමේ සහ ආපදාවන් සඳහා අනුගත වීමේ පියවර රාශියක් ගෙන ඇත.

<u>විශේෂ අවස්ථා</u>

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 12 ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 14 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම

## 2.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික

**සෞඛ්‍ය අංශය**

දැනට රටෙහි සමස්ත සෞඛ්‍ය සේවා අවශ්‍යතාවයෙන්, ආසන්න වශයෙන් 50% ක් පමණ බාහිර සෞඛ්‍ය ප්‍රතිකාර සේවාවන් ද, 90 % ක් අභ්‍යන්තර රෝගී ප්‍රතිකාර සේවාවන් හා 99 % ක් රෝග නිවාරණ ප්‍රතිකාර සේවාවන් ද සපයනු ලබන්නේ රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා පද්ධතිය මඟිනි. කෙසේ නමුත්, බෝ නොවන රෝග ව්‍යාප්තිය, වැඩිහිටි සෞඛ්‍ය සේවා අවශ්‍යතාවයන් සහ ක්ෂය රෝගය සහ ඩෙංගු වැනි බෝවන රෝග පැතිරීම වැඩිවීමත් සමඟ ඇති වන සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුතු සෞඛ්‍ය පහසුකම් ලබා දීම සඳහා රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා පද්ධතිය තව දුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. එබැවින්, රජය විසින් සෞඛ්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් හඳුන්වාදීම හා සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා වන අයෝජනය වැඩි කිරීම සිදු කරන ලදී.

2019 වර්ෂය තුළදී, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් ඉලක්ක ලඟා කර ගැනීම සඳහා සෞඛ්‍ය අංශය වෙනුවෙන් පහත සඳහන් කාර්යන් ඉටු කර ලදී.

- ව්‍යාපෘති යෝජනා 17ක් ඇගයීමට ලක් කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කර තිබේ. එම නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.
- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 8 ක් සඳහා නිරීක්ෂණ සකසන ලදී.
- සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය මූල්‍ය සහායෝගය ලබා ගැනීම සඳහා ලෝක බැංකුව, ජපන් සහයෝගිතා ඒජන්සිය, ලෝක සෞඛ්‍ය සංවිධානය ආදී ආයතනවල නිලධාරීන් සමඟ රැස්වීම ගණනාවක් පවත්වනු ලැබිණ.
- වර්ෂ 2019.07.05 දින කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී නව ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයට අනුව සංවර්ධන ව්‍යාපෘති යොමු කිරීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වූ අතර එහිදී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අදාල අංශ වල නිලධාරීන්ට නව ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය අනුව ව්‍යාපෘති සකස් කිරීම පිළිබඳ පුහුණුවක් ලබා දීම.
- 2020 – 2022 මධ්‍ය කාලීන අය වැය රාමුව සඳහා රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කරන ලදී.

**ආගමික , සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතා අංශය.**

ආධ්‍යාත්මික වශයෙන් දියුණු සහ එකමුතු සමාජයක් ගොඩනැංවීමට දායක වීම උදෙසා ආගමික, සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතා අංශයේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරීමට 2019 වර්ෂ තුළ රාජ්‍ය ආයෝජන ලබා දී ඇත. මෙම අංශය තුළින්, බෞද්ධාගම, හින්දු , කතෝලික හා මුස්ලිම් යන ආගමික ක්ෂේත්‍ර ද සංස්කෘතිය, උරුමයන් , ජාතික ලේඛණාරක්ෂාව , ජාතික කෞතුකාගාරය , රාජ්‍ය භාෂා සහ සමාජ ඒකාබද්ධතා යන අංශ ආවරණය වේ.

ඉහත අංශයට අදාළව 2019 වර්ෂය තුළ දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ඉටු කර ඇත.

- ව්‍යාපෘති වාර්තා 13 ක් ඇගයීමට ලක් කිරීම.
- එක් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා නිරීක්ෂණ ලබා දී ඇති අතර එක් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා අදහස් ලබා දී ඇත.
- කොළඹ, බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2019.07.05 දින "රාජ්‍ය නිලධාරීන් සහ සැලසුම් කරුවන් සඳහා නව සංවර්ධන ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය පිළිබඳ වැඩමුළුවේ දී "ආගමික , සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතා අංශයට අදාළ නිළධාරීන් පුහුණු කිරීම .
- ආගමික, සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතා අංශයට අදාළ ව්‍යාපෘති පෙළගැස්ම යාවත් කාලීන කර 2019 – 2021 මධ්‍ය කාලීන අයවැය රාමුව සැකසීමට දායක වීම සහ ආගමික, සංස්කෘතික සහ සමාජ ඒකාබද්ධතා අංශයට අදාළ රැස්විම් සඳහා සහභාගී වීම.

**ක්‍රීඩා අංශය**

ක්‍රීඩාවේ වර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා බෝ නොවන රෝග සඳහා රජය විසින් දරනු ලබන පිරිවැය අවම කර ගනිමින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම සඳහා ක්‍රීඩාව මෙරට සංස්කෘතිය හා සමාජය තුළ අනිවාර්යය අංගයක් බවට පත් කිරීම අරමුණු කර ගෙන රජය විසින් ක්‍රීඩා අංශය සඳහා 2019 වර්ෂය තුළ ආයෝජනය සිදු කර ඇත.

ඉහත අරමුණු ළඟා කර ගැනීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය තුල පහත සඳහන් වැඩ කටයුතු ඉටු කර ඇත.

- ව්‍යාපෘති වාර්තා තුනක් ඇගයීමට ලක් කර නිර්දේශ ජාතික අය වැය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන සඳහා යොමු කර ඇත.

- ක්‍රීඩා අංශයට අදාළ අමාත්‍යාංශ මණ්ඩල සංදේශ තුනක් හා අවබෝධතා ගිවිසුම් 01 ක් සඳහා අදහස් ලබා දී ඇත.

- වර්ෂ 2019.07.05 දින කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති "නව ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයට අනුව සංවර්ධන ව්‍යාපෘති යොමු කිරීම සඳහඅදාළ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවේ දී ක්‍රීඩා අමාත්‍යාංශය හා අදාල අංශ වල නිලධාරින්ට නව ව්‍යාපෘති ඉදිරියේ සිටීමේ ආකෘතියට අනුව ව්‍යාපෘතිය සකස් කිරීම පිළිබඳ පුහුණුවක් ලබා දීම.

- 2019 – 2021 මධ්‍ය කාලීන අය වැය රාමුව සැකසීමට අවශ්‍ය ව්‍යාපෘති ප්‍රමුඛතා ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ ක්‍රීඩා අංශයට අදාල රැස්වීම් සඳහා සහභාගී වීම.

## 2.7 අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ

**අධ්‍යාපන අංශය**

අධ්‍යාපනයේ ගුණාත්මකබව, සමානාත්මතාව හා අදාළබව වැඩිදියුණු කිරීමට ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රමෝපායන් රාශියක් 2019 වසරේදී හඳුන්වාදෙන ලදි. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය ඇතුළුව පාසැල් පද්ධතියේ සිදු කළ යුතු වන වෙනස් කම් සිදු කිරීම සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ.

තවද, පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, පන්ති කාමර, විද්‍යාගාර සහ විද්‍යාගාර උපකරණ වැනි අවශ්‍ය මූලික පහසුකම් පාසැල්වල ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණ.

2019 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මග සහ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

- අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP), සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (GEM) යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.

- අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 12ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

- අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 5 ක් ඇගයීම.

**උසස් අධ්‍යාපන අංශය**

2019 වර්ෂය තුළ, උසස් අධ්‍යාපන අංශය තවදුරටත් වර්ධනය වූ අතර, රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන අතරම, විශේෂයෙන්ම අ.පො.ස (උසස් පෙළ) තාක්ෂණවේදී විෂය ධාරාව හදාරන ලද සිසුන් සඳහා විශ්වවිද්‍යාල වරම් ලබා දීම සඳහා තාක්ෂණවේද පීඨ ඇතුළු නව අධ්‍යයන පීඨ ආරම්භ කරන ලදී. එමෙන්ම, නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පවතින අධ්‍යයන පාඨමාලා නවීකරණය කිරීම මඟින් නිසි රැකියා අවස්ථා ලබා ගත හැකි උපාධිධාරීන් බිහිකිරීම පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ. ඊට අමතරව, කර්මාන්ත අංශය සමඟ සබඳතා ගොඩනගාගැනීම සඳහා විශ්වවිද්‍යාල රැසක් විසින් පියවර ගන්නා ලද අතර, විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපනය කරන ලදී.

රටේ ශිෂ්‍ය ප්‍රජාවට පවතින උසස් අධ්‍යාපන අවස්ථා නංවාලීමේ අරමුණින්, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විධිමත් කිරීමට ද, ඒවා තවදුරටත් පුළුල් කිරීමට ද පියවර රැසක් ගන්නා ලදී.

2019 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වන සිසුන් සඳහා රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට ණය පහසුකම් ලබා දීමේ යෝජනා ක්‍රමය පිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

- උසස් අධ්‍යාපන අංශයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ ඒ පිළිබඳව මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 32 ක් ඇගයීම.

**නිපුණතා අධ්‍යාපන හා තරුණ කටයුතු අංශය**

රටෙහි තිරසාර ආර්ථික සංවර්ධනක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රමබලකායක් සිටීම අවශ්‍ය වේ. එබැවින් වසර 2020 වන විට ජාතික වෘත්තීය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට විවිධ ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සහිත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම අරමුණු කර ඇත.

මෙහිදී හැකියාවන්, මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීමත් වෘත්තීය පුහුණු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ ගුණාත්මක වෘත්තීය පුහුණුවකට ඇති ප්‍රවේශය ශක්තිමත් කිරීමත් තුලින් ගෝලීය ආර්ථිකය තුළ සේවා නියුක්ත විය හැකි ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම මූලික ප්‍රතිපත්තිය වේ.

2019 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

ව්‍යාපෘති වාර්තා 03 ක් ඇගයීමට ලැබුණු අතර ව්‍යාපෘති අවශ්‍යතාවය නිසි ලෙස සාධාරනීකරණය කර ඇති ව්‍යාපෘති ඇගයීම් කර අවසන් කර ඇති අතර ඊට අදාල නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

අමාත්‍ය මණ්ඩල සංදේශ 8 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම

ව්‍යාපෘති සැකසීමට අදාල ගැටළු හා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන විට අන්තර් ගත කල යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ යටතේ ඇති විවිධ නිපුණතා සංවර්ධන ආයතන සමඟ හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා දැනුවත් කිරීම.

එමෙන්ම අලුතෙන් හඳුන්වාදෙන ලද ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතිය යටතේ නව ව්යාපෘති වාර්තා සකස්කල යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම.

තවද, වසර 13ක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය සමඟ ඒකාබද්ධ වෙමින් වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධවත් එහිදී පාසැල් හැරයන්නන් වෘත්තීය පුහුණු අංශය කරා යොමු කරවා ගැනීම සම්බන්ධවත් ගැනීමට අවශ්‍ය පියවර හා ක්‍රමෝපායන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙන ලද අතර වෘත්තීය පුහුණ අධ්‍යාපනයේ ගුණත්වය හා අදාලත්වය ඉහළ නැංවීම පිළිබඳ සාකච්ඡා පැවැතිවීම.

රාජ්‍ය ආයෝජන සැලැස්ම යටතේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයේ ඉදිරි සැලසුම් හා ආයෝජන ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම හා ලැයිස්තුගත කිරීම.

නිපණතා ආංශීය සංවර්ධන වැඩසටහනට අදාලව අන්තර් අමාත්‍යාංශ කමිටු රැස්වීම පැවැත්වීම හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අදාල නිලධාරින් සමඟ සාකච්ඡා පවත්වා ගැටළු විසදීම.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යපෘති යෝජනා ඉදිරිපත්කිරීමේ නව ආකෘතික පත්‍රය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයට අදාල සියලුම ආයතන සඳහා පැවැත්වීම

**තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශය**

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්,මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර, පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. තවද 2019 වර්ෂයේදී, වෙබ් අඩවි වල ආරක්ෂාව තහවුරු කිරීම හා අන්තර් ජාලය භාවිතයෙන් සිදුවන අපයෝජන අවම කිරීම අරමුණු කොටගත් ව්‍යාපෘති සඳහා විශේෂ අවධානය යොමු කෙරුණි.

<u>නිමකළ කාර්යයන්</u>

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 03 ක් ඇගයීමට ලක්කර ඇත
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04 කට නිරීක්ෂණ සපයා ඇත
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ආංශික සටහන් සැකසීම
- තොරතුරු තාක්ෂණහා සන්නිවේදන අංශයට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපර්තමේන්තුව සඳහා ලේඛන කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන මූලික කටයුතු සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම, අවශ්‍ය දත්ත ඇතුලත් කිරීමේ සැකිල්ල සකස් කිරීම, මෘදුකාංගය සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය වෙත ලබා දීම හා ඔවුන් සමඟ සමීපව කටයුතු කරමින් අවශ්‍ය මග පෙන්වීම ලබා දීම
- තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මගින් පවත්වන ලද වැඩමුළු, වැඩසටහන් සහ සාකච්ඡ සඳහා සහභාගී වීම සහ සක්‍රීයව දැනුම හුවමාරු කිරීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත්කිරීමේ නව ආකෘතික පත්‍රය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශයට අදාල සියලුම ආයතන සඳහා පැවැත්වීම

**විද්‍යා තාක්ෂණ හා පර් යේෂණ**

ජාත්‍යාන්තර ප්‍රමිතිවලට අනුකූලව මෙරට තාක්ෂණ හා පර්යේෂණ අංශය සංවර්ධනය කිරීම රජයේ ප්‍රධාන ඉලක්කයකි. අධිතාක්ෂණික කර්මාන්තකරණය රටක ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් කරා යොමු කරයි. දේශීය සමාගම් වල ගුණාත්මකභාවය, ඵලදායීතාවය සහ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රජය ඉහළ තාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන තිබේ. නැනෝ තාක්ෂණය සහ ජෛව තාක්ෂණය ඇතුළු උසස් තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය ආහාර සැකසීම, පටක රෝපණය සහ පොහොර වැනි කර්මාන්ත සඳහා අගයක් එකතු කර ඇත.

<u>නිමකළ කාර්යයන්</u>

- ව්‍යාපෘති වාර්තා 08 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපර් තමේන්තුව හා විදේශ සම්පත් දෙපර්තමේන්තුව වෙත යොමු කිරීම
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04 කට නිරීක්ෂණ සපයා ඇත
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනා ඇගයීම පිළිබඳ සාකච්ඡා කීපයකට සහභාගී වීම
- ජාතික මූලික අධ්‍යයන ආයතනය, කාර්මික තාක්ෂණ ආයතන හා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය සමග විද්‍යා හා තාක්ෂණ අංශයට අදාල ව්‍යාපෘති නැවත සකස් කිරීම සඳහා දැනුවත් කිරීමේ සාකච්චා පැවැත්වීම
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ව්‍යපෘති යෝජනා ඉදිරිපත්කිරීමේ නව ආකෘතික පත්‍රය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අංශයට අදාල සියලුම ආයතන සඳහා පැවැත්වීම

## 2.8 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ

**ප්‍රාදේශීය සංවර්ධන අංශය**

පවත්නා ප්‍රාදේශීය විභවතාවත්, සුවිශේෂතා හා විවිධතා හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්ත්වයක් ඉහළ මට්ටමකට දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.

ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිම සඳහා ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනිමේ වැදගත්කම මෙම අංශය මඟින් අවධාරණය කෙරේ. වර්තමාන ආර්ථික වර්ධනය, මානව සංවර්ධනය සහ සමාජ දර්ශකයන් ප්‍රාදේශීය සංවර්ධන ඉදිරිදර්ශනය තුළ අවධානය යොමු කළ යුතුය.බොහොමයක් ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් අදාළ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ මගින් සිදු කරණු ලැබේ

ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම පිළිබඳව නිදහසින් පසු සියළුම පාලන තන්ත්‍රයන් හී අවධානය යොමු වී ඇත. කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු පිහිටුවීම, පළාත් සභා හා පලාත් පාලන ක්‍රමය ස්ථාපිත කිරීම, ගම් උදාව වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරීම, ගම නැගුම, පුරනැගුම සහ ගම්පෙරළිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයකි. ප්‍රාදේශීය සංවර්ධන අංශය අනෙකුත් අංශ ගණනාවක් සමඟ ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන බැවින් එකී අංශ මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ද ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා වැදගත් වේ.

<u>විශේෂ කාර්යයන්</u>

- ව්‍යාපෘති යෝජනා 22 ක් ඇගයීමට ලක් කර ඇත.
- කැබිනට් සංදේශ 06 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහනේ ප්‍රාදේශීය සංවර්ධන අංශය යාවත්කාලීන කිරීම.

- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- ලෝක බැංකු LDSP සඳහා උපදේශනය.

**සංචාරක අංශය**

සංචාරක අංශය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කර්මාන්තයක් ලෙස පිළිගෙන ඇති අතර එය ආර්ථිකයට ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මාර්ගයක් ලෙස 2018 වර්ෂයේදී සංචාරක පැමිණීම මිලියන 2.3 ක් සමඟ ඇමරිකානු ඩොලර් මිලියන 4,381 ක් දායක කර තිබේ. සංචාරක දැක්ම 2025 ට පහසුකම් සැපයීමට සහ එක්සත් ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ ලඟාකර ගැනීමට සහය වීම සඳහා නව සංචාරක උපායමාර්ගික සැලැස්ම (TSP) 2017 - 2020 හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් පිළිබිඹු කරමින් ඉහළ වටිනාකමකින් යුත් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීම ඉලක්ක කර ඇති නව සංචාරක උපාය මාර්ගික සැලැස්ම අනුව සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට රජය සැලසුම් කරයි. සංචාරක කර්මාන්තය සමාජයිය වශයෙන් පරිපූර්ණ හා පරිසර හිතකාමී ලෙස නිර්මාණය කරමින් නව වෙළඳපොල වලින් සංචාරක ආකර්ශනය සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම සහ දේශිය හා විදේශීය සංචාරකයින් අතර ඉහල ඉල්ලුමක් ඇති නව නිෂ්පාදන පිරිනැමීමට ද කටයුතු කරයි. තවද සංචාරක ආකර්ශනය මෙන්ම සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිවල පෞද්ගලික අංශය සමග PPP ව්‍යාපෘති කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත. රට තුල විවිධ ස්ථානවල ජනප්‍රිය සංචාරක ආකර්ශනය ලබාගත හැකි ව්‍යාපෘති ලෙස දැඳුරුඔය සංචාරක පරිසර කලාපය සහ සංස්කෘතික ත්‍රිකෝණය ආශ්‍රිත සංචාරක ව්‍යාපාතිය, කොළඹ කොටුව තුල උරුම ගොඩනැගිලි ව්‍යාපෘතිය, ගාල්ල හා මාතර සංචාරක ව්‍යාපෘති, කොග්ගල සහ මාතර යන ගෝල්ෆ් පිටි, කොග්ගල මුහුදුගුවන් යානා කෞතුගාරය, කුච්චවේලි සහ කල්පිටිය ආදිය රජය විසින් හඳුනාගෙන ඇත. බෝගම්බර සංස්කෘතික හා සංචාරක මධ්‍යස්ථානය හා මත්තල සංචාරක කලාපය වැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවති. ඉහළ වියදම් ධාරිතාවක් ඇති සංචාරකයින් ආකර්ශනය සඳහා මෙය වඩාත් ප්‍රසංශනීය වනු ඇත.

මීට අමතරව, සංචාරක කර්මාන්තය ආශ්‍රිත පවතින ගැටලු විසඳීම සඳහා රජය තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර එමගින් සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය (ජනප්‍රිය සහ ජනප්‍රිය නොවන ගමනාන්තවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම), NVQ මට්ටමේ නිපුණතා සහිත 10,000 ක් ශ්‍රමිකයින් පුහුණු කිරීම, ආයතනික සංවර්ධනය සිදු කිරීම අපේක්ෂා කරයි.

<u>විශේෂ කාර්යයන්</u>

- රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ සඳහා කැබිනට් නිරීක්ෂණ 03 ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 01 ක් ඇගයීමට ලක් කර ඇත.
- සංචාරක අංශයට අදාලව රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- ලෝක බැංකු තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය සඳහා උපදේශනය.

**සමාජ ආරක්ෂණ අංශය**

<u>සමාජ ආරක්ෂණ අංශයට අදාල ප්‍රගතිය</u>

සමස්ත සමාජ ආරක්ෂණ අංශය සඳහා පුළුල් ඒකාබද්ධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ කාන්තාවන්, ළමයින්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින්ගේ ඇතුළු සමාජයේ අවශ්‍ය අංශයන්ගේ ජීවන තත්වය නගාසිටුවමින් රටේ සංවර්ධනයට ඔවුන් දායක කරවීම සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය සිය සමස්ත ප්‍රයත්නය දරයි. ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වැනි රේඛීය අමාත්‍යාංශ, ළමුන්, වරප්‍රසාද නොලත් කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයන් ඇතුළු අවදානමට ලක් වූ කොටස්වල යහපැවැත්මේ යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ.

<u>ඉටුකරන ලද කාර්යයන්</u>

- **ව්‍යාපෘති වාර්තා සඳහා ඇගයීම් වාර්තා සහ කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ සකස් කිරීම** – ව්‍යාපෘති වාර්තා 10 ක් සඳහා ඇගයීම් වාර්තා සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ අදාල අමාත්‍යාංශවලට යොමු කිරීම. අදාල අමාත්‍යාංශවලින් යොමුකරන ලද කැබිනට් පත්‍රිකා 08 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

- **ප්‍රතිපත්ති සකස් කිරීම සහ සමාලෝචනය** – ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය **සමාලෝචනය** කර නිරීක්ෂණ ලබා දී ඇත

- **ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතිය විශ්ලේෂණ කිරීම හා මානව සංවර්ධන වාර්තාව (කෙටුම්පත) සඳහා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබා දෙන ලදී**

- **රැස්වීම් සහ වැඩමුළු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම**– අදාළ අමාත්‍යාංශ මඟින් සංවිධානය කරන ලද මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ වැඩමුළු සඳහා සහභාගී වීම සහ සමාජ ආරක්ෂණ අංශයේ උන්නතිය සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම.

## 2.9 රාජ්‍ය කළමනාකරණය හා පාලන

නව තාක්ෂණය භාවිතය තුළින් රාජ්‍ය සේවයේ ඵලදායිතාවය ඉහළ නංවන අතරම නවීන කළමණාකරණ භාවිතයන් හා පරිපාලන ක්‍රමවේද තුළින් රාජ්‍ය සේවයේ අවහිරතාවයන් මඟ හරවමින් කාර්යක්ෂම හා මහජන හිතවාදී සේවාවක් සැපයීමට කළමනාකරණ ක්‍රමවේද හා පරිපාලන ක්‍රම වෙනස් කිරීම රාජ්‍ය කළමනාකරණයේ ප්‍රධාන උපායමාර්ගය වේ.

කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා රාජ්‍ය සේවය තුළ ආයතනික, මානව සහ සේවා සැපයීමේ ඵලදායිත්වය යන අංශයන්හි ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කරගෙන

රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරනු ලබයි. මේ නිසා ඵලදායී හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන දෙකෙහිම ධාරිතා වර්ධනය ඉතා වැදගත් වේ. මෙම දෙපාතීමේන්තුවේ රාජ්‍ය කළමනාකරණ හා රාජ්‍ය පාලන අංශය ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 5 ක් ආවරණය කරනු ලබයි. එනම් රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධිකරණ ක්ෂේත්‍රය සහ විදේශ කටයුතු සහ විශේෂ වියදම් ශීර්ෂ 25 ක් ඊට ඇතුළත් වේ. පසුගිය වසර තුළ මෙම අංශයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායක වී ඇත.

- ව්‍යාපෘති යෝජනා 29 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, නිර්දේශ කිරීමේ ලිපි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලදී.
- රාජ්‍ය කළමනාකරණ අංශයට අයත් විවිධ අමාත්‍යාංශවලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් මෙහෙයවන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම සහ එම ආයතනවල වර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාල අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.

## 2.10 විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය

ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 29 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය යටතේ රුපියල් 278, 272,000 ක ව්‍යාපෘති යෝජනා 2077 ක් නිර්දේශ කර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

## 03 පරිච්ඡේදය- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**ඒසීඒ -එෆ්**

2019.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

| අයවැය (2019) | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදාම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදයම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදයම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 105,489,000 | 92,455,000 | ඒසීඒ -3 |
| - | තැන්පතු | | 29,115 | 97,537 | ඒසීඒ -4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 8,093,164 | 5,669,037 | ඒසීඒ - 5/5(අ) |
| - | වෙනත් ලැබීම් | | 4,725,440 | 4,643,642 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | 118,336,719 | 102,865,216 | |
| - | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | 118,336,719 | 102,865,216 | |
| | **අඩු කළා: වියදම** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 72,929,000 | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 72,655,651 | 63,292,763 | |
| 26,260,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 25,218,218 | 24,279,080 | ඒසීඒ - 2(ii) |
| 860,000 | සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 859,075 | 890,243 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **100,049,000** | මුළු පුනරාවර්තන වියදම් (ඇ) | | **98,732,944** | **88,462,086** | |
| | **මූලධන වියදම්** | | | | |
| 3,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි | 10 | 2,672,121 | 3,538,775 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දියුණු කිරීම | | | | |
| | මූලධනවත්කම් අත්පත් කර ගැනීම | 11 | 2,937,101 | 825,100 | |
| - | ප්‍රාග්ධන පැවරීම | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 4,500,000 | හැකියා වර්ධනය | 14 | 4,411,292 | 2,159,137 | |
| 327,100,000 | වෙනත් මූලධන වියදම් | 15 | 40,862,055 | 27,089,276 | |
| 337,591,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 50,882,568 | 33,612,287 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 5,619,305 | 6,815,025 | |
| | තැන්පතු ගෙවීම් | | 29,115 | 97,537 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 5,590,190 | 6,717,489 | ඒසීඒ-5/5(අ) |
| | මුළු වියදමඋ = (ඇ+ඉ+ඊ) | | 155,234,817 | 128,889,399 | |
| 437,640,000 | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | (36,898,098) | (26,024,183) | |

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2019** දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2019** | **2018** |
| | - | රු. | රු. |

<u>මූල්‍ය නොවන වත්කම්</u>

| | | | |
|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | **ඒසීඒ-6** | 102,640,033 | 100,926,730 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ-5/5(අ)** | 14,335,196 | 16,838,170 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ-3** | 15,227 | 93,099 |
| **මුළු වත්කම්** | | 116,990,456 | 117,857,999 |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම් | | 14,335,196 | 16,838,170 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 102,640,033 | 100,926,730 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(ආ)** | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ-4** | - | - |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ-3** | 15,227 | 93,099 - |
| **මුළු වගකීම්** | | 116,990,456 | 117,857,999 |

පිටු අංක 05.සිට 54 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහ: පිටු අංක 55 සිට 62 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහ: මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍ය ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එ සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| ..................... | ..................... | ..................... |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : එස්.ආර්.ආටිගල | නම : ආර්.එච්.ඩබ්.ඒ.කුමාරසිරි | නම : එන්. විජේවීර |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : 2020.02. 24 | දිනය : 2020.02. 18 | දිනය : 2020.02.15 |

ආර්. එච්. ඩබ්ලිව්. ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ - 01

එන්. විජේවීර
අධ්‍යක්ෂ
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ - 01

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ
මහලේකම් කාර්යාලය
කොළඹ 01

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | සටහන | |
|---|---|---|
| | 2019<br>රු. | 2018<br>රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |

| | | |
|---|---|---|
| ආදයම් නොවන ලැබීම් | | |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම් | 201,392 | 856,157 |
| අග්‍රිම ලැබීම් | 105,489,000 | 92,455,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **105,690,392** | **93,311,157** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 89,701,255 | 80,512,599 |
| සහනාධාර සහ මාරු කිරීම්වියදම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 195,667 | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 15,227 | 93,099 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය(ආ)** | **89,912,149** | **80,605,698** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඇ )=(අ)-( ආ)** | **15,778,243** | **12,705,459** |
| <u>**ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්**</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම | | |
| අත්තිකාරම් අය කර ගැනීම | 282,439 | 224,315 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **282,439** | **224,315** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජනඅත්පත් කර ගැනීම් | 11,880,197 | 7,898,960 |
| අත්තිකාරම් ගෙවීම් | 4,151,370 | 4,933,278 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **16,031,567** | **12,832,238** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(15,749,128)** | **(12,607,923)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)** | **29,115** | **97,536** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූමුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |

| | | |
|---|---|---|
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූමුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| ***අඩු කළා - මුදල් වැය කිරීම්:*** | | |
| දේශීය ණයආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 29,115 | 97,536 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | 29,115 | 97,536 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | (29,115) | (97,536) |
| **මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - -**

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ**

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** (11) | 97,440,000 | 100,049,000 | 98,732,944 | 98.68 |
| උප එකතුව | 97,440,000 | 100,049,000 | 98,732,944 | 98.68 |
| **ප්‍රාග්ධන**<br>දේශීය අරමුදල් (11) | 8,900,000 | 10,491,000 | 10,020,513 | 95.52 |
| **ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් සපයන** **වැඩසටහන**<br>විදේශ ණය (12) | 325,000,000 | 325,000,000 | 39,002,371 | *16.18 |
| විදේශ මුල්‍යනය ආශ්‍රිත දේශීය පිරිවැය (17) | 2,100,000 | 2,100,000 | 1,859,684 | 88.56 |
| උප එකතුව | 336,000,000 | 337,591,000 | 50,882,568 | 15.07 |
| | | | | |
| මුළු එකතුව | 433,440,000 | 437,640,000 | 149,615,512 | 34.18 |

* රාජ්‍ය ආයතන වලට රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට හා ව්‍යාපෘතිවල මූලික ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය **ව්‍යාපෘති සකස්කිරීමේ පහසුකම් සපයන** වැඩසටහන **මගින් සිදු කරනු ලබයි.** 2018 – 2019 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති 9 ක් මූලිකවම හඳුනාගන්නා ලදි. ඉන් ව්‍යාපෘති 7 ක් ආරම්භ කළ අතර සවිස්තරාත්මක සැළසුම් දැනටමත් සකස් කර ඇත. ව්‍යාපෘති දෙකක් කල්දමා ඇත. මුදල් ඌන උපයෝජනයට හේතු පහත දක්වා ඇත.

- අයවැය චක්‍රලේඛ නො 4/2019 සහ 5/2019 අනුව රු. මිලියන 84 ක් ( සමස්ත ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් 25%) අනිවාර්ය ඉතුරුකිරීම් ලෙස වෙන් කරන ලදි.
- අපේක්ෂිත කාලයට පෙර ණය ගිවිසුම් ක්‍රියාත්මක වීම නිසා ව්‍යාපෘති තුනකට අපේක්ෂිත වියදම් නොදරන ලදි.
- බොහොමයක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරනුයේ අදාල නිළධාරීන් බැවින් ණය අරමුදල් අපේක්ෂිත පරිදි වියදම් නොවුණි.
- රාජ්‍ය ප්‍රමුඛතා වෙනස් වීම මත සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණි.
- අයවැය සීමාවීම මත සමහර ව්‍යාපෘති අදියර වශයෙන් ක්‍රියාත්මක කරන ලදි.

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | අදාල නොවේ | | | | |

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 102,640,033 | 102,640,033 | | |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුනුම I ලෙස දක්වා ඇත

04පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන | 100% | | |
| අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන | | 82% | |
| සපයන ලද නිරීක්ෂණ ගණන | 100% | | |
| අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන | 100% | | |
| නිර්දේශ කරන ලද යෝජනා ගණන | 100% | | |

05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල සංවර්ධන සැලසුම්, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා තිරසාර සංවර්ධන අරමුණු අග්‍රගතකර එහි අදාල ඉලක්ක ලගාකරගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලදි.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.
අදාල නැත

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 59 | 46 | 13 |
| තෘතීයික | 02 | 00 | 02 |
| ද්විතියික | 28 | 17 | 11 |
| ප්‍රාථමික | 29 | 20 | 09 |

**06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීමෙන් රාජකාරි ඉටු කිරීමේදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දුනි

**06.3 මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| නිවාඩු හසුරුවන නිලධාරීන්ගේ රාජකාරිය | 01 | 01 දිනක් | 3000.00 | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම |
| කාර්යාල කළමනාකරණ පද්ධතිය | 01 | 06 දිනක් | 13000.00 | | දේශීය | -එම - |
| ප්‍රවාහන කළමනාකරණය | 01 | 02 දිනක් | 7000.00 | | දේශීය | -එම - |
| විනය සහ කාර්යාල පද්ධතිය | 11 | 02 දිනක් | 93500.00 | | දේශීය | -එම - |
| සවිස්තරාත්මක ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය | 01 | 05 දිනක් | 30000.00 | | දේශීය | -එම - |
| විශ්‍රාම වැටුප් වැඩසටහන | 01 | 01 දිනක් | 5000.00 | | දේශීය | -එම - |
| DIPPCA - මිලෝඩා විසිනි | 06 | 01 දිනක් | 600000.00 | | දේශීය | -එම - |
| මූල්‍ය නියාමනය | 01 | 02 දිනක් | 8500.00 | | දේශීය | -එම - |
| ශාස්ත්‍රපති උපාධි වැඩසටහන | 02 | 01 අවුරුද්දක් | 165000.00 | | දේශීය | -එම - |
| විගණන විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම | 03 | 01 දිනක් | 21000.00 | | දේශීය | -එම - |
| රාජ්‍ය අංශයේ වෘත්තීය ගණකාධිවරුන්ගේ සදාචාරාත්මක වගකීම | 01 | 01 දිනක් | 1500.00 | | දේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සවිස්තරාත්මක මිලදීගැනීමේ ක්‍රියාපටිපාටිය | 02 | 02 දිනක් | 17000.00 | | දේශීය | -එම - |
| මූල්‍ය ප්‍රකාශන (අවසාන ගිණුම්) | 02 | 01 දිනක් | 14000.00 | | දේශීය | -එම - |
| නව බදු නීතිය | 02 | 01දිනක් | 14000.00 | | දේශීය | -එම - |
| රියදුරු සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම හා විනය | 07 | 02 දිනක් | 59500.00 | | දේශීය | -එම - |
| පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ජාතික සමුළුව | 01 | 01 දිනක් | 3000.00 | | දේශීය | -එම - |
| ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම- (SESEC) - දකුණු කොරියාව | 01 | 18-19 මාර්තු | 57710.00 | | විදේශීය | -එම - |
| සංවර්ධන සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම් ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම - බෙල්ජියම | 01 | 12-16 පෙබරවාරි | 581754.00 | | විදේශීය | -එම - |
| SASEC සමුද්‍රීය සහයෝගීතාව - වැඩ සාප්පුව | 01 | 6-8 පෙබරවාරි | 27332.00 | | විදේශීය | -එම - |
| කෘෂිකර්මාන්තය ට අදාළ මැදිහත්වීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බහු අංශ ප්‍රවේශය තුළින් පෝෂණය ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළුව; ජාතික ප්‍රතිපත්තිවල සිට ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක කිරීම | 01 | සැප්තැම්බර් | 58207.00 | | විදේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දක්වා - පෘතුගාලය | | | | | | |
| ගංවතුර ආරක්ෂණ පූර්ව අනතුරු ඇඟවීම සහ හදිසි ප්‍රතිචාර - ඇමරිකා එක්සත් ජනපදය | 02 | 18-25 | 89984.00 | | විදේශීය | -එම - |
| දකුණු ආසියාවේ තායිලන්තයේ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (එන්ඩීසී) වැඩි දියුණු කිරීම පිළිබඳ උප කලාපීය වැඩමුළුව | 01 | 26-27 සැප්තැම්බර් | 22333.00 | | විදේශීය | -එම - |
| ජපානයේ ආසියානු ආර්ථික ඒකාබද්ධතාවය පිළිබඳ සම්මන්ත්‍රණය / වැඩමුළුව | 01 | 13-14 ජුනි | 56330.00 | | විදේශීය | -එම - |
| ඉන්දුනීසියාවේ භූතානය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන රටවල පෝෂණය සඳහා රාජ්‍ය මූල්‍යය තක්සේරු කිරීම සඳහා හරස් රටක උපදේශන වැඩසටහන | 01 | 09-13 සැප්තැම්බර් | 57284.00 | | විදේශීය | -එම - |
| කෘෂිකර්ම නවීකරණ වැඩසටහනට (TAMAP) වියට්නාමයේ පාර්ශවකරුවන් ගේ තාක්ෂණික සහාය | 02 | 12-16 අගෝස්තු | 101524.00 | | විදේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (ඩිප්ලෝමා) දෙවන රට සංචාරය - එක්සත් රාජධානිය - (මිලෝඩා විසිනි) | 01 | 04-14 අගෝස්තු | 642701.00 | | විදේශීය | -එම - |
| යටිතල පහසුකම් පාලනය පිළිබඳ තුන්වන ගෝලීය වට රවුම - දකුණු කොරියාව | 01 | 23-24 මැයි | 120432.00 | | විදේශීය | -එම - |
| දෙවන රට අධ්‍යයන චාරිකාව - මැලේසියාව (SLIDA විසින්) | 02 | සැප්තැම්බර්29ඔක්තෝබර් 05 | 104424.00 | | විදේශීය | -එම - |
| ඉන්දුනීසියාවේ භූතානය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන රටවල පෝෂණය සඳහා රාජ්‍ය මූල්‍යය තක්සේරු කිරීම සඳහා හරස් රටක උපදේශන වැඩසටහන | 01 | 09-13 සැප්තැම්බර් | 55603.00 | | විදේශීය | -එම - |
| ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාදේශීය පුහුණු වැඩමුළුව සිංගප්පූරුව | 01 | 26 පෙබරවාරි -02 මාර්තු | 39390.00 | | විදේශීය | -එම - |
| මුල් ළමාවිය අධ්‍යාපනයට ප්‍රමුඛතාවය දීම පිළිබඳ වැඩමුළුව - චීනය | 01 | 23-27 සැප්තැම්බර් | 37140.00 | | විදේශීය | -එම - |
| “සමාජ ආරක්ෂාව පිළිබඳ | 02 | 16-27 සැප්තැම්බ | 250788.00 | | විදේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඇකඩමිය" පිළිබඳ පාඨමාලාව | | ර් r | | | | |
| ඉල්ලුම් නොකළ යෝජනා ප්‍රතිපත්තිය පිළිබඳ වැඩමුළුව - සිංගප්පූරුව | 01 | 17-18 සැප්තැම්බ ර් | 22185.00 | | විදේශීය | -එම - |
| ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - චීනය වයිනාස් ආහාර බෙදාගැනීම ආරක්ෂක ප්‍රතිපත්තිය සහ පළපුරුද්ද | 01 | 24-27 අප්‍රියල් | 42920.00 | | විදේශීය | -එම - |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අයවැයකරණය පිළිබඳ හරස් රටක ඉගෙනුම් වැඩමුළුව - ඉන්දියාව | 01 | 11-12 සැප්තැම්බ ර් | 160 | | විදේශීය | -එම - |
| IPBES ආසියාව - පැසිෆික් කලාපීය තක්සේරුව - නේපාලය පිළිබඳ විද්‍යා ප්‍රතිපත්ති සංවාදය සඳහා පුහුණුව | 01 | 25- පෙබරවාරි -01 මාර්තු | 75225.00 | | විදේශීය | -එම - |
| දැනුම හුවමාරු සංචාරය - වියට්නාමය | 09 | 27 OCT to 02 Novembe r | 468,225.0 0 | | විදේශීය | -එම - |
| කලාපීය වැඩමුළුව ඉන්දුනීසියාව ආර්ථික ගෝලීයකරණ සංඛ්‍යාලේඛන | 02 | 13-15 ජුනි | 127930.00 | | විදේශීය | -එම - |
| බෙල්ට් සහ මාර්ග මුලපිරීම යටතේ | | 09-29 අගෝස්තු | 167122.00 | | විදේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මධ්‍යම හා දිගු කාලීන සංවර්ධන සැලැස්ම පිළිබඳ ජොෂ් Senior නිලධාරීන් සඳහා 2019 සම්මන්ත්‍රණය.- චීනය | | | | | | |
| ගෝලීය ළමා පෝෂණ සංසදය (අධ්‍යයන චාරිකාව) | 01 | 01-08 දෙසැම්බර් | 59326.00 | | විදේශීය | -එම - |
| පුහුණු පා se මාලාව - ඇමරිකා එක්සත් ජනපදය - ලෝක බැංකු කම්කරු හා සංක්‍රමණික මූලික පා ඨමාලාව | 01 | 27-ඔක්තෝබර්- 10 නොවැම්බර් | 104051.00 | | විදේශීය | -එම - |
| ඉන්දියාවේ දිල්ලි මෙට්‍රෝ කෝපරේෂන් ලිමිටඩ් හි මෙහෙයුම් පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | 16-21 සැප්තැම්බර් | 36976.00 | | විදේශීය | -එම - |
| දකුණු ආසියාවේ සේවා සැපයුම් පද්ධති - තායිලන්තය | 01 | 2-4 දෙසැම්බර් | 29663.00 | | විදේශීය | -එම - |
| පානීය ජලය, සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව යන අංශවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා ගෝලීය විශ්ලේෂණය සහ සනීපාරක්ෂක හා පානීය ජලය තක්සේරු කිරීම (GLAAS) සහ ට්‍රැක් ෆින් මෙවලම් පිළිබඳ | 01 | 15-17 ඔක්තෝබර් | 44384.00 | | විදේශීය | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කලාපීය වැඩමුළුව - ඉන්දියාව | | | | | | |
| තරුණ නායකයින් ශ්‍රී ලංකාවේ AGRI ව්‍යාපාර / AGRI සංචාරක පාඨ මාලාව ජපානය | 01 | 21 අගෝස්තු - 08 සැප්තැම්බර් | 138057.00 | | විදේශීය | -එම - |
| ජාත්‍යන්තර නිපුණතා සංසදය ඩිජිටල් කඩාකප්පල්කාරී යුගයේ නිපුණතා සහ රැකියා වල අනාගතය - පිලිපීනය | 01 | 27-29 අගෝස්තු | 69023.00 | | විදේශීය | -එම - |
| පුහුණු පාඨ මාලාව, සංවර්ධනය සඳහා වූ ජාතික උපායමාර්ගය පිළිබඳ 6 වන කලාපීය පුහුණු පාඨ මාලාව - චීනය | 01 | 11-14 නොවැම්බර් | 69210.00 | | විදේශීය | -එම - |
| ශාස්ත්‍රපති උපාධිය | 03 | 2019-2021 | 410,860.00 | USD 523,498 | විදේශීය | -එම - |

07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | වාර්ෂික මුලා ප්‍රකාශ | **අනුකූල වේ** | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | **අනුකූල වේ** | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | **අදාල නොවේ** | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | **අදාල නොවේ** | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | **අදාල නොවේ** | | |
| 1.6 | වෙනත් | **අදාල නොවේ** | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත 2017 ඉදිරිපත් කර ඇත | යාවත්කාලීන තොරතුරු යැවීමට කටයුතු කරමි |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ** | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | **අනුකූල වේ** | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | **අනුකූල වේ** | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | **අනුකූල වේ** | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** | | |

**අවසානය.**

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීආර්ඊ/ඩී/එන්පීඩී/02/19/14 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 මැයි [illegible] දින

ගණන්දීමේ නිලධාරී

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) මූලධන වියදම් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 85 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයයන් 05 ක මූලික වියදම් ඇස්තමේන්තුව සහ පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 මගින් සංශෝධනය කිරීම, මූලික වියදම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට සෘණ 30 හා සියයට 100 අතර පරාසයක විය.

### 2.2 නීතිරීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX පරිච්ඡේදය<br>7.2 වගන්තිය | ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය ඉක්මවූ පසු නිල නිවාසවලින් ඉවත්වීමට ලබාදුන් සහන කාලය ඉක්මවූ විට ආයතන සංග්‍රහය ප්‍රකාරව අයකළ යුතු මුදල් අයකර නොතිබුණි. තවද 2019 අගෝස්තු මාසය වනවිට ගිවිසුම් කාලය ඉක්මවූ නිලධාරීන් 04 දෙනෙකු දීන දීර්ඝ කරමින් තවදුරටත් නිල නිවාසවල පදිංචි වී සිටී. |
| (ආ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 | නිල නිවාසවලට අදාල ගොඩනැගිලි පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත 2017 ඔක්තෝබර් 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතුව තිබූ නමුත් මෙ දක්වා එපරිදි කටයුතු කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එස්.එම්.ඩී.එස්.සුදීජ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට